සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
(ඉඩම් අංශය)

2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2023 වර්ෂය සඳහා මෙම අමාත්‍යාංශයට අවශ්‍ය පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සපයාගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

01. අයදුම්පත්‍ර බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2023" යනුවෙන් සඳහන් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් 2022.12.28 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. එක් එක් අයිතමයන් සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර රු.500.00 ක (ආපසු නොගෙවන) ලියාපදිංචි ගාස්තුවක් ඉඩම් අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවීමෙන් පසු අදාල අයදුම් පත්‍රය 2022.12.27 දින තෙක් සතියේ දින වල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙතින් ලබා ගත හැකි අතර අයදුම්පත්‍රය මිලදී ගැනීමට පෙර කොන්දේසි පිළිබඳව දැන ගැනීමට එම අයදුම්පත්‍ර පරීක්ෂාකර බැලීමේ හැකියාව පවතී.

අනු අංකය	සැපයුම් අයිතමය
1	ටයර් / ටියුබ් සැපයීම
2	වාහන බැටරි සැපයීම
3	වාහන අලුත් වැඩියා කිරීම
4	වාහන කුෂන් අලුත් වැඩියාව
5	වාහන විදුලි අලුත් වැඩියාව
6	වාහන වායු සමීකරණ පද්ධති අලුත් වැඩියාව
7	වාහන වාරසේවා කිරීම
8	පරිගණක හා උපාංග, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර හා ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියාව

වැඩි විස්තර දුරකතන අංක 011 2797524 / 011 2797523 මගින් ගිණුම් අංශය හෝ 011-2797500 අමතා 4351 දිගුව මගින් ප්‍රවාහන අංශය අමතා ලබා ගත හැකිය

ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
මිහිකත මැදුර,
ඉඩම් මහලේකම් කාර්යාලය,
නො.1200/6,රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.